**ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය - 2014**
**----------------------------------------------------**

ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**
----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (**ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව්කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

02. **මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ප්‍රමිතිවලට අනුකූලව කටයුතු නොකළ අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02

(i) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගිණුම්ගත කළයුතු වත්කම් අත්පත් කර ගැනීම සඳහා ලැබුණු රු.187,359,260 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති ස්ථාවර වත්කම් මිලදී ගැනීමට අදාල මුදල් ගලායාම් රු.158,236,832 ක් උපචිත පදනම මත ගිණුම්ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09

සමාලෝචිත වර්ෂය අවසානයට වූ ලිපිද්‍රව්‍ය තොගය තුළ 2009 වර්ෂයේ මුද්‍රණය කරන ලද ප්‍රයෝජනයට ගත නොහැකි පිරිවැය රු. 116,895 ක්වූ ශිෂ්‍ය අත්පොත් 293 ක් ඇතුළත්ව තිබූ නමුත් එවැනි තොග අගය කිරීම සම්බන්ධව ගිණුම් ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් උපචිත පදනම මත ගිණුම් පිළියෙල කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු වියදම් රු.2,925,867 ක් හා ලැබිය යුතු ආදායම් රු.266,104 ක් වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ ගෙවිය යුතු බාහිර පාඨමාලා වියදම් වෙනුවෙන් රු. 345,000 ක අධි වෙන්කිරීමක් සිදුකර තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල රු. 181,070 ක්වූ වියදම අධි වෙන්කිරීමෙන් ලියාහැර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වියදම සම්බන්ධව හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන්ගෙන් මිළදීගත් එකතුව රු.305,023 ක්වූ ජ්‍යාගධන භාණ්ඩ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3 **නොසැසඳු පාලන ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ උපලේඛන සැසඳීමේදී ලැබිය යුතු ශිෂ්‍යාධාර හා ලැබිය යුතු මහපොළ අතර පිළිවෙලින් රු. 660,671 ක හා රු.765,100 ක වෙනසක්

නිරීක්ෂණය විය. තවද ඉකුත් වර්ෂයේ සිට ඉදිරියට ගෙනා හඳුනා නොගත් ලැබිය යුතු ශිෂ්‍යාධාර රු. 170,321 ක් ඇතුලත්ව තිබූ බව නිරීක්ෂණය විය.

2.2.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් එකතුව රු. 4,408,295 ක් වටිනා ගිණුම් විෂයයන් 04 ක් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| **(i)** | ආපසු ගෙවිය යුතු තැන්පත් | 1,997,840 | **i.** කාල විශ්ලේෂණ |
| **(ii)** | ආපසු ගෙවිය යුතු ආරක්ෂක තැන්පත් | 647,953 | **ii.** කේවල ශේෂ ලැයිස්තුව |
| **(iii)** | පොදු තැන්පත්-පුනරාවර්තන | 1,524,607 | **iii.** තැන්පත් ලේඛන |
| **(iv)** | පොදු තැන්පත්-ප්‍රාග්ධන | 237,895 | |
| | එකතුව | 4,408,295 | |

2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 ජනවාරි සිට ජුලි දක්වා වූ කාලය වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකු වෙත ගෙවා තිබුණු රු.93,546 ක පර්යේෂණ දීමනා අයකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 7,179,806 ක්වූ ආපදා ණය ශේෂය තුළ 2007 හා 2008 වර්ෂවලදී නිලධාරීන් 02 දෙනෙකු වෙත ලබාදුන් රු.165,183 ක ආපදා ණය ශේෂයන් අයවීම අත්හිටවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 96,000 ක්වූ උත්සව අත්තිකාරම් ණය ශේෂය තුළ 2010, 2011 හා 2013 අප්‍රේල් මාසවලදී නිලධාරීන් 03 දෙනෙකු වෙත ලබාදුන් රු. 10,000ක උත්සව අත්තිකාරම් ණය ශේෂයන් අයවීම අත්හිටවී තිබුණි.

(ඈ) 2006 වර්ෂයේ සිට 2015 දක්වා කාලය තුළ විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු ඉටුකරන ලද මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට **(CECB)** ගෙවිය යුතු රු. 61,989,351 ක් නිරවුල් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.4 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | **නීති,රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | |

| | | |
|---|---|---|
| | **(i)** 37 (1) වගන්තිය | සංයුතිය නියම කළ තෝරා ගැනීමේ කමිටුවක නිර්දේශ මත පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරී පත්කළ යුතු නමුත් පාලක සභාවේ අනුමැතියට යටත්ව උපකුලපතිවරයා විසින් පැවරුම් පදනම මත විශ්‍රාමික ලේඛකාධිකාරිවරයකු එම තනතුර සඳහා පත් කර තිබුණි. |
| | **(ii) 108 (3)(2)**වගන්තිය | විගණකාධිපතිවරයාගේ වාර්තාව එවීමෙන් පසු මාස තුනක් ඇතුළත ඒ වාර්තාවෙහි පෙන්නුම් කරන ලද කරුණු සම්බන්ධයෙන් ගන්නා ලද හෝ ගැනීමට යෝජිත පියවර විගණකාධිපතිවරයා වෙත දැන්විය යුතු නමුත් 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතින් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වගන්තිය හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත | විධිවිධාන ප්‍රකාරව අවුරුදු 02 කට වැඩි කාලයක් තිස්සේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල රාජකාරි ඉටුකරනු ලබන පුහුණුලාභීන් 28 දෙනෙකු වෙනුවෙන් දායක මුදල් අරමුදල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,100,000,044 ක් වටිනා දේපල පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) | 2003 ජුනි 03 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.1 හා 7.2 වගන්ති | විශ්වවිද්‍යාල ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි. |
| (ඊ) | 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 03 වගන්තිය | ගෙවීම් වටිනාකම රු. 25,000 කට වැඩි ගෙවීම් මත රු.25 ක මුද්දර ගාස්තු අයකරගත යුතු නමුත් නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 16 කදී එකතුව රු.1,019,661 ක ගෙවීම් සම්බන්ධයෙන් නියෝග අනුව කටයුතු කර නොතිබුණි. |
| (උ) | 2011 පෙබරවාරි 21 දිනැති අංක 449 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කාර්ය පැවරුම් පදනම මත වූ පත්වීම්, දින 45 ක් නොඉක්මවන හා පැවරුමකට ගෙවිය හැකි උපරිම මුදල රු.30,000 ක් වුව ද ඊට පටහැනිව කාර්ය පැවරුම් පදනම මත විශ්‍රාමික නිලධාරීන් 03 දෙනෙකු වෙත චක්‍රලේඛ ප්‍රතිපාදන සීමාව ඉක්මවා ගෙවන ලද රු.718,539 ක් සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඖ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උපාධි අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 01 වන පරිච්ඡේදය හා මුදල් රෙගුලාසි 758 | සමාලෝචිත වර්ෂය සඳහා නියමිත කාල පරතර තුළදී වාර්ෂික සමීක්ෂණයට අමතරව ගබඩා සමීක්ෂණ සිදුකර නොතිබුණි. |
| (එ) | 2010 පෙබරවාරි 05 දිනැති අංක 920 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 5(**viii**) ඡේදය | වැටුප් පරිවර්තන සිදුවන අවස්ථාවන්හිදී ආචාර්යවරුන් 26 දෙනෙකුට අදාල බැඳුම්කර සංශෝධනය කර නොතිබුණි. |
| (ඒ) | 2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ ආයතනික චක්‍රලේඛය | ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට හිමි නිවාසවල, තනිකඩ බද්ධ නිවාසවල පදිංචි නිලධාරින්ගෙන් නිවාස කුලිය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඔ) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ **v** පරිච්ඡේදයේ 7.6 ඡේදය | බැඳුම්කර හා ගිවිසුම් කොන්ත්‍රාත් කඩකිරීම සම්බන්ධයෙන් ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් රු.8,220,772 ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතුව තිබුණි. |

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.59,812,116 ක ඌනතාවය ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.123,412,661 ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.63,600,545 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 04. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍යයින් 1,900 දෙනෙකුගේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් දරන ලද පිරිවැය රු.457,802,863 ක් වූ අතර ඒක ශිෂ්‍ය පිරිවැය රු.240,949 ක් විය. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් **1,423** දෙනෙකුගේ අධ්‍යයන පිරිවැය රු.401,635,931 ක්වූ අතර, ඒක ශිෂ්‍ය පිරිවැය රු.**282,246** ක් විය. මේ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.41,297 කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දිවයිනේ විශ්වවිද්‍යාලවල 1:17 ක්වූ සාමාන්‍ය කථිකාචාර්ය ශිෂ්‍ය අනුපාතයට සාපේක්ෂව විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ශිෂ්‍ය අනුපාතය 1:16 ක් විය.

(ඇ) සංයුක්ත සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා සිසුන් 605 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබූ නමුත් සිසුන් 507 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි.ඒ අනුව අපේක්ෂිත සංඛ්‍යාවෙන් සිසුන් 98 දෙනෙකු එනම් සියයට 16 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

(ඇ) 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්වආදායම් ඉපයීමේ පාඨමාලා පැවැත්වීමෙන් ඉපයූ ආදායම සියයට 37 කින් අඩු වී තිබුණි.

4.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක : 05/0183/035/001 යටතේ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා 2008 පෙබරවාරි 10 දින පැවැත්වුණ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ඉඩම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාලව ගත් තීරණය අනුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා දැනට වෙන්කරනු ලැබ ඇති හෙක්ටයාර් 30.9667 ක ඉඩම්වල අයිතිය විශ්වවිද්‍යාලය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 **අරමුදල් උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුවෙන් මූලධන වියදම් සඳහා ලබාදී තිබුණු රු. 230,000,000 ක්වූ ප්‍රතිපාදනයෙන් රු. 71,763,168 ක් ඉතිරිකර තිබුණි. එය සමස්ථ මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 31 කි.

(ආ) තොරතුරු තාක්ෂණ සංවර්ධනය, ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්, ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය, ව්‍යාපාර උපදේශන ඒකකය හා නවෝත්පාදන භාණ්ඩ යන ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කර තිබුණු රු.7,000,000 ක මුළු ප්‍රතිපාදනයම වියදම් නොකර ඉතිරි කර තිබුණි.

(ඇ) පර්යේෂණ දිරිමත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අයවැයගත මූලධන ප්‍රතිපාදනය වූ රු.25,000,000 කින් උපයෝජනය කර තිබුනේ රු. 554,266 ක් පමණි. ඒ අනුව රු. 24,445,734 ක ප්‍රතිපාදන ඉතිරියක් වී තිබූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 98 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් "බදුල්ල" විසින් පටක රෝපණ ව්‍යාපෘතිය සඳහා ලබා දෙන ලද රු.3,323,000 ක් පොදු තැන්පත් ප්‍රාග්ධන ගිණුමට බැරකර තිබූ නමුත් 2015 මාර්තු 31 දින වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

4.4 **ආර්ථික නොවූ ගනුදෙනු**

සමාලෝචිත වර්ෂයේ සෑම මසකම බාහිර පාඨමාලා වලින් ඉපයූ ආදායමෙන් රු.ලක්ෂ 10 ක මුදලක් ජංගම ගිණුමේ තිබූ නමුත් එය ආයෝජනය කර පොළියක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 ජුනි 30 දින මිලදීගෙන තිබූ රු.322,560 ක් වටිනා ගිනි ආරක්ෂණ සේප්පු 05 ක් සමාලොචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී ඉංජිනේරු වැඩහල සඳහා මිලදී ගෙන තිබූ රු. 14,060,480 ක් වටිනා 3-**Axis CNC** යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.

(ඇ) බාහිර පාඨමාලා අංශයට රු.1,117,933 ක වටිනාකමැති ස්ථාවර වත්කම් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ "HETC" ව්‍යාපෘතිය හරහා පිරිනමා තිබූ නමුත් එම වත්කම් ඵලදායි ලෙස බාහිර පාඨමාලා අංශයේ අරමුණු ඉටුකර ගැනීමට උපයෝජනය කර නොමැති බව දක්නට ලැබිණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශයේ පරිපාලන කටයුතු පහසුකර ගැනීමට 2013 වර්ෂයේ මිලදී ගත් රු.222,768 ක් වටිනා ගිණුම්කරණ පරිගණක මෘදුකාංගය වර්තමානයේ චෙක්පත් මුද්‍රණය සඳහා පමණක් යොදා ගන්නා බව දක්නට ලැබිණි.

4.6 **දෘශ්‍ය අක්‍රමිකතා**
-------------------
සමාලෝචිත වර්ෂයේදී පැවැත්වූ උපාධි ප්‍රදානෝත්සවය ඡායාරූප ගත කිරීම හා වීඩියෝගත කිරීමට අදාල සැපයුම්කරු තෝරාගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5, 5.2.1(අ), 6.3.2, 6.3.3, 6.3.3.1 (අ) මාර්ගපදේශයට පටහැනිව කටයුතු කර තිබුණු අතරම මාර්ගෝපදේශයේ 1.21 හි සඳහන් අරමුණු හා මාර්ගෝපදේශයේ 1.4 හි සඳහන් ආචාරධර්ම උල්ලංඝණය කර තිබුණි. එමෙන්ම තෝරාගත් සැපයුම්කරු විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් අනුව 10"× 12" ප්‍රමාණයේ ඡායාරූපයක් රු.100 ක් බව සඳහන් වන නමුත් උපාධි අපේක්ෂකයන් වෙත ඡායාරූපයක් රු.336 ක් වැනි මුදලකට අලෙවි කර ඇති බව විගණනයේදී තහවුරු විය. ඒ අනුව රු. 104,784 ක් අයථා අන්දමින් උපයා ගැනීමට විශ්වවිද්‍යාලය විසින් ආධාර අනුබල ලබාදී තිබුණි. තවද මේ සම්බන්ධයෙන් හිමිකම හා අයිතිය විශ්වවිද්‍යාලය සතු වන නමුත් එම අයිතිය සම්බන්ධව විශ්වවිද්‍යාල අරමුදලට කිසිදු අයකිරීමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.7 **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**
-----------------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේදී ඇගළුම් කර්මාන්ත ගොඩනැගිල්ල සඳහා රු.41,247,644 ක් වැයකර නවීකරණය කරන ලද නමුත් වහලින් ජලය කාන්දු වීම හේතුවෙන් සිවිලිම අබලන් වෙමින් පැවතුණ අතර යථෝක්ත ගොඩනැගිල්ලේ වහල සමාලෝචිත වර්ෂයේ ජනවාරි - අප්‍රේල් කාල පරිච්ඡේදය තුළ පුනරුත්තාපනය කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම් සකස් කිරීමෙන් පසුව අවශ්‍ය ප්‍රමාණපත්‍ර (**BOQ**) සකස් කිරීම නිවැරදි කරගැනීමට හැකියාව තිබුණු නමුත් දිගින් දිගටම මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (**CECB**) විසින් ප්‍රමාණපත්‍ර (**BOQ**) සකස් කිරීමේදී වැය විෂයයන් වල සියයට 50 සිට සියයට 300 දක්වා ඇස්තමේන්තු වල සත්‍ය අගයන් අතර වැඩ ඉටුකිරීමේදී විචලනයන් දක්නට තිබුණි.

(ඇ) 2010 වර්ෂයේදී ආරම්භ කර 2013 වර්ෂයේදී වැඩ නිමකළ යුතු ඉදිකිරීම් ව්‍යාපෘති 12 ක් සමාලෝචිත වර්ෂය දක්වාම ආරම්භ කිරීමට කටයුතු නොකිරීමෙන් ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවායාම අවම කිරීම ගැටළු සහගත වේ.

4.8 **කාර්ය මණ්ඩල පරිපාලනය**
-------------------------------
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ 213 ක් වූ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 70 ක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ vi වන කොටසේ 33 වන වගන්තිය ප්‍රකාරව පත්කළ යුතු විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති තනතුර 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පුරප්පාඩුව පැවතිණි.

(ඇ) ලේඛකාධිකාරි තනතුර 2014 මාර්තු 12 දින සිට පුරප්පාඩුව පවතින අතර 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 37(1) වගන්තිය ප්‍රකාරව එම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට විශ්වවිද්‍යාලය අපොහොසත්වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 113 ක් වූ අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 70 ක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අසමත් වී තිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයේ පර්යේෂණාගාර 32 ක් ඇති නමුත් සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්මික කාර්ය මණ්ඩලයේ තනතුරු 12 න් තනතුරු 10 කම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අසමත් වී තිබුණි.

(ඊ) 2002 ජනවාරි 08 දිනැති අංක 794 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ දක්වා ඇති අවම සුදුසුකම්වලට පටහැනිව 2008 සැප්තැම්බර් 05 දිනැති අංක **UGC/HR/**1/2/452 දරන පත්වීම් ලිපිය අනුව ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුර සඳහා නිළධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර තිබුණි.

(උ) අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් කථිකාචාර්යවරුන් 05 දෙනෙකුගේ පත්වීම් ලිපිය ප්‍රකාරව පත්වීම ස්ථිර කිරීමට පත්වීම් දින සිට වසරක් ඇතුළත සම්පූර්ණ කළ යුතු ඉගැනීම් /ඉගැන්වීම් ක්‍රම ශිල්ප ඇතුළත් සේවක සංවර්ධන පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර නොතිබුණි.

(ඌ) 1982 අප්‍රේල් 06 දිනැති අංක 166 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධාන අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයට කථිකාචාර්යවරුන් පත් කිරීමට අදාලව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී කටයුතු කිරීමෙන් කථිකාචාර්යවරුන් සිව්දෙනෙකුට අදාල පත්වීම් බල රහිත විය.

(එ) විශ්වවිද්‍යාලයේ අනුමත සේවක සංඛ්‍යාවෙහි පොත් තබන්නා තනතුරක් අනුමත වී නොතිබුණ නමුත් 2014 ජුලි 24 දින අංක 638/2014 දරන ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව වර්තමානයේ විශ්වවිද්‍යාලය වෙත සේවා සපයන පෞද්ගලික ආයතනයෙන් පොත් තබන්නා තනතුර සඳහා සේවකයන් දෙදෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණි.

4.9 **වාහන උපයෝජනය**

වාහන සඳහා ඇතිකරගෙන තිබූ ගිවිසුම් අනුව මාසිකව ධාවනය කළයුතු කිලෝමීටර් ප්‍රමාණයට වඩා අඩුවෙන් ධාවනය කරනු ලබන කිලෝමීටර් ප්‍රමාණයටද ගෙවීම් කිරීමේ කොන්දේසියක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී වාහන 05ක් සම්බන්ධයෙන් ධාවනය නොවූ කි.මී. 29,897 ක් වෙනුවෙන් රු.914,878 ක මුදලක් ගෙවා තිබුණි.

05. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

5.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2002 මැයි 24 දිනැති අංක පීඑෆ්/පීඊ.21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2015 මාර්තු 31 දිනදීය.

5.2 **සංයුක්ත සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 – 2018 කාල පරිච්ඡේදයට අදාල සංයුක්ත සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති 21 ක් ආරම්භ කර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගතව නොතිබුණු අතර ඉටුකරගත යුතු ඉලක්කයන්ගේ මූල්‍ය අගයන් දක්වා නොතිබුණු බැවින් ප්‍රගතිය ඇගැයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.

5.3 **ක්‍රියාකාරී සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ භෞතික ප්‍රගතිය මැන බැලීම සඳහා කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඇ) සංයුක්ත සැලැස්මේ හා ක්‍රියාකාරි සැලැස්මේ භෞතික ප්‍රගතිය මැන බැලීම හා ඊට අදාල තීරණ ගැනීම සඳහා උපායමාර්ගික කළමනාකරණ හා සංවර්ධන කමිටුවක් පිහිටුවා තිබූ නමුත් එම කමිටුව මාස්පතා රැස්වී ප්‍රගති සමාලෝචනයක් කර නොතිබුණි.

5.4 **විගණන හා කළමනාකරණ කමිටු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 15 ඡේදය ප්‍රකාරව වර්ෂයකට අවම වශයෙන් විගණන කමිටු රැස්වීම් 04ක් පැවැත්විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) දැනට මිලදීගෙන ඇති පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීනව ක්‍රියාත්මක කිරීම, අනධ්‍යයන කාර්යමණ්ඩලයේ සියළු නිලධාරින් වෙත රාජකාරි පැවරීමේ ලිපි නිකුත් කිරීම, විගණන විමසුම් ලේඛනය නඩත්තු කිරීම සහ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම සම්බන්ධයෙන් 32 වැනි විගණන කමිටුවේදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

5.5 **ප්‍රසම්පාදන සැලැස්ම**

විශ්වවිද්‍යාලය සතුව වෙබ් පිටුවක් හා ප්‍රමාණවත් තොරතුරු තාක්ෂණ පහසුකම් ඇති නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 මාර්ගෝපදේශය ප්‍රකාරව විද්‍යුත් ප්‍රසම්පාදන කටයුතු විද්‍යුත් මාර්ගයෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

5.6 **අයවැය ලේඛනමය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තුගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදන වලින් සියයට 13 ක සිට සියයට 61 ක් දක්වා වූ විචලනයන් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක් සඳහා වෙන්කර තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 15 ක සිට සියයට 91 ක් දක්වා වූ සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් සේවක සංවර්ධන ආයතනය හා උපාධි ලෝගුව මිලදී ගැනීම සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන අනුමත කර ගැනීමකින් තොරව පිළිවෙලින් රු. 2,782,153 ක හා රු. 94,500 ක වියදම් දරා තිබුණි.

5.7 **නොවිසඳී ඇති විගණන ඡේද**

---

2012 සැප්තැම්බර් 21 දින පැවැති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් උපදෙස් අනුව අපජලය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීමට මේ දක්වා විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

06. **පද්ධති හා පාලනයන්**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) ගබඩා පාලනය
(ඇ) මූල්‍ය කළමනාකරණය හා වියදම් පාලනය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) වාහන උපයෝජනය